# මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
# நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சு
# MINISTRY OF FINANCE PLANNING AND ECONOMIC DEVELOPMENT



මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01, இலங்கை.
The Secretariat, Colombo 01, Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011-2484500, 011-2484600, 011-2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2449823
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.treasury.gov.lk


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இல / My No. | PFD/PMD/Clari/NPC/2026/16-II | ඔබේ අංකය / உமது இல. / Your No. | | දිනය / திகதி / Date | 11.06.2026 |

රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක : **03/2026**

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්

පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්

දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ දිස්ත්‍රික් ලේකම්වරුන්

පළාත් පාලන ආයතන ප්‍රධානීන්

රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ රජය සතු සමාගම්වල සභාපතිවරුන්

**පවතින ගෝලීය අර්බුදකාරී තත්ත්වය සහ දිට්වා සුළි කුණාටුවේ බලපෑම අවම කිරීම සඳහා රජයේ ප්‍රසම්පාදනය සඳහා අනුගමනය කළ යුතු විශේෂ පියවර**

ගෝලීය අර්බුදකාරී වාතාවරණය සහ දිට්වා සුළි කුණාටුවේ අහිතකර බලපෑම හේතුවෙන් මෙරට ආර්ථිකය මුහුණදී ඇති ගැටළුකාරී තත්ත්වය හමුවේ රජයේ ප්‍රසම්පාදන කටයුතු අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පහසුකම් සැලසීම සඳහා ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ (NPC) එකඟතාවය ඇතිව මෙම චක්‍රලේඛය නිකුත් කෙරේ.

2. අංක CP26/0991/827/038 හා 2026.06.01 දිනැති අමාත්‍ය මණ්ඩලයේ තීරණය ප්‍රකාරව, අගතියට පත් පාර්ශ්වයන්ට සහන සැලසීම සඳහා චක්‍රලේඛයක් නිකුත් කරන ලෙස භාණ්ඩාගාර ලේකම්වරයාට උපදෙස් ලබා දී ඇත.

3. පළාත් සභා ඇතුළු සියළුම රජයේ ආයතන විසින් පහත සඳහන් ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතු බවට අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර ඇත;

   අ. 2026 මාර්තු මස පළමු වන දින හෝ ඊට පෙර ලංසු කැඳවීම අවසන් කර ඇති සහ මැදපෙරදිග කලාපයේ අස්ථාවර තත්ත්වය හේතුවෙන් බලපෑමට ලක් වූ භාණ්ඩ, වැඩ, උපදේශන නොවන සේවා සහ උපදේශන සේවා ප්‍රසම්පාදන සඳහා.

   ආ. දිට්වා සුළි කුණාටුවෙන් බලපෑමට ලක් වූ භාණ්ඩ, වැඩ, උපදේශන නොවන සේවා සහ උපදේශන සේවා ප්‍රසම්පාදන සඳහා.

ඒ අනුව, මෙම චක්‍රලේඛයේ විධිවිධාන 2026 සැප්තැම්බර් 30 වන දින දක්වා වලංගු වේ.

වැඩ ප්‍රසම්පාදන සහ කොන්ත්‍රාත්තු

i. මෙම නියෝගය නිකුත් කරන දින වන විට ප්‍රදානය කර ඇති මාස තුනක් (03) හෝ ඊට අඩු කාල සීමාවකින් යුත් වැඩ කොන්ත්‍රාත්තු වල ඉදිකිරීම් ද්‍රව්‍ය සහ ඉන්ධන මිල ඉහල යාම හේතුවෙන් සිදුවන පිරිවැය වැඩිවීම, හානිපූර්ණය සඳහා ඉඩ සැලසීම වෙනුවෙන් රජයේ ආයතන විසින් ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) "සරල කරන ලද (සංයුක්ත) මිල ගැලපුම් සූත්‍රය" (සංයුක්ත දර්ශක භාවිතා කරනු ලබන) අදාළ කර ගත යුතුය.

ii. මිල ගැලපුම් විධිවිධාන සපයා නොමැති දැනටමත් ප්‍රදානය කර ඇති මාස තුනකට වඩා වැඩි කාල සීමාවකින් යුත් වැඩ කොන්ත්‍රාත්තු සඳහා, ඉදිකිරීම් යෙදවුම්වල උච්චාවචනයන් හේතුවෙන් පැන නගින මිල ගැලපුම් සඳහා ඉඩ සැලසීමට CIDA "සම්මත මිල ගැලපුම් සූත්‍රය" (තනි දර්ශක භාවිතා කරන) හෝ CIDA "සරල කළ (සංයුක්ත) මිල ගැලපුම් සූත්‍රය" (ප්‍රසම්පාදන අස්ථිත්වයට ලංසු කැඳවීමේ ලේඛන නිකුත් කිරීමට පෙර යෙදවුම් ප්‍රතිශත ගණනය කිරීමට නොහැකි අවස්ථාවලදී) භාවිතා කළ යුතුය.

භාණ්ඩ, උපදේශන නොවන සේවා සහ උපදේශන සේවා ප්‍රසම්පාදන සහ කොන්ත්‍රාත්තු

නිෂ්පාදක මිල දර්ශක (PPI), භාණ්ඩ ප්‍රවාහන සහ නැව්ගත කිරීමේ දර්ශක සහ නිසි බලධාරීන් විසින් ප්‍රකාශයට පත් කරන ලද අනෙකුත් ජාත්‍යන්තරව පිළිගත් වෙළඳපල දර්ශක ඇතුළුව, ජාත්‍යන්තරව හෝ දේශීයව ප්‍රකාශයට පත් කරන ලද අනෙකුත් සුදුසු දර්ශක අනුගමනය කිරීමෙන් භාණ්ඩ, උපදේශන නොවන සේවා සහ උපදේශන කොන්ත්‍රාත්තු සඳහා සුදුසු මිල ගැලපුම් යාන්ත්‍රණයක් යොදාගත යුතුය.

4. මිල ගැලපුම් සඳහා යොදාගත හැකි දර්ශක නොමැති අවස්ථාවලදී, අදාළ පරිදි, නිශ්චිත තත්වයන් යටතේ දරන ලද සැබෑ අතිරේක වියදම් මත පදනම්ව මිල ගැලපීම් සලකා බැලිය හැකිය. සැබෑ අතිරේක වියදම් මත පදනම් වූ ඕනෑම හිමිකම් පෑමක් ලිඛිත සාක්ෂි මත පදනම් විය යුතු අතර, සැපයුම්කරු මිල කියුම්, සැපයුම්කරුගේ බිල්පත්, රේගු බිල්පත්, රේගු ප්‍රකාශන සහ අදාළ ලියකියවිලි, නෞභාරපත්‍ර, නැව්ගත කිරීමේ සහ භාණ්ඩ ප්‍රවාහන බිල්පත්, විනිමය අනුපාත වාර්තා, රක්ෂණ ලේඛන, ගෙවීම් පිළිබඳ සාක්ෂි සහ ප්‍රසම්පාදන ආයතනය විසින් පිළිගත හැකි යැයි සැලකෙන වෙනත් ඕනෑම ආධාරක සාක්ෂි ඇතුළුව, නමුත් ඒවාට පමණක් සීමා නොවී, පිළිගතහැකි ලේඛන සාක්ෂි සමඟ සනාථ කළ යුතුය.

5. ඒ අනුව, ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් සහ ගණන්දීමේ නිලධාරීන් විචලන සමාලෝචන කමිටුවේ නිර්දේශය මත පදනම්ව, මිල ගැලපුම් සහ කොන්ත්‍රාත් කාල සීමාවන් දීර්ඝ කිරීම සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගත හැකිය.

6. තවද, ලංසු සුරක්ෂණ සහ කාර්ය සාධන සුරක්ෂණ රාජසන්තක කිරීම අත්හැරීම, ඇවර කරන ලද අලාභ අයකර නොගැනීම සහ ඒ හා සමාන ගිවිසුම්ගත බැඳීම්වලින් පැන නගින කාරණා සම්බන්ධයෙන්, අදාළ ප්‍රසම්පාදන කමිටුවල නිර්දේශ මත පදනම්ව සහ අවශ්‍ය යැයි සැලකෙන විට, ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා විසින් සුදුසු පරිදි පත් කරන ලද විශේෂ කමිටුවක් මත පදනම්ව සුදුසු ක්‍රියාමාර්ග ගත හැකිය.

7. තවද, ඉදිරියේදී සිදුකරනු ලබන ඉදිකිරීම් කොන්ත්‍රාත්තු නිසි ලෙස පරිපාලනය සහ කළමනාකරණය කිරීම සඳහා, සියලුම ප්‍රසම්පාදන අස්ථිත්ව විසින් ප්‍රසම්පාදන සඳහා ලංසු ලේඛන සහ කොන්ත්‍රාත් ලේඛන සකස් කිරීමේදී භාණ්ඩ, වැඩ සහ උපදේශන නොවන සේවා සඳහා වන ප්‍රසම්පාදන මාර්ගෝපදේශ - 2024 හි 5.16 වගන්තිය සහ ප්‍රසම්පාදන අත්පොතෙහි විධිවිධාන වලට අනුකූල විය යුතුය.

8. ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් සහ ගණන්දීමේ නිලධාරීන් මිල ගැලපුම් හේතුවෙන් ඇතිවන අමතර මූල්‍ය බලපෑම් තක්සේරු කළ යුතු අතර, අවශ්‍ය පරිදි අයවැය ප්‍රතිපාදන මාරු කිරීම හෝ අතිරේක අයවැය ප්‍රතිපාදන මඟින් ප්‍රමාණවත් අයවැය ප්‍රතිපාදන ලබා ගැනීම සහතික කළ යුතුය.

9. මෙම චක්‍රලේඛය සම්බන්ධයෙන් තවදුරටත් පැහැදිලි කිරීමක් අවශ්‍ය වන්නේ නම් දුරකථන අංක 011 2484614, 011 2484618 හෝ 011 2484987 මඟින් රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන අංශය ඇමතිය හැක.

**අත්.කළේ. ආචාර්ය හර්ෂණ සූරියප්පෙරුම**
**භාණ්ඩාගාර ලේකම්**

පිටපත්:

1. සභාපති, ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව
2. සභාපති, මුදල් කොමිෂන් සභාව
3. ජනාධිපති ලේකම්
4. අග්‍රාමාත්‍ය ලේකම්
5. අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
6. විගණකාධිපති